I·O·G·T

**Alcohol and Drug Information Centre**

**ADIC**

*No.40/18, Park Road, Colombo 5, Sri Lanka.*
*Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484*
*E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk*
*Web Site: http://www.adicsrilanka.org*

2020.04.05

කොවිඩ් ආසාදනයෙන් මිය යන 70ට අඩු අය අතර, වැඩි සංඛ්‍යාවක් දුම්බොන්නන් බව සනාථ වී ඇතැයි මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) පවසයි.

මේ නිසා තවමත් දුම්පානය අත් නොහළ අය කොවිඩ් 19 වෛරසයෙන් වෙසෙසින්ම ආරක්ෂා කරගත යුතු බවද එම මධ්‍යස්ථානය පවසයි.

මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කරන එම ආයතනය මෙසේ ද පවසයි.

නිරෝගී වැඩිහිටියන් අතර කොවිඩ් 19 වෛරසය අසාදනය හේතුවෙන් බොහෝ විට මිය යන්නේ 70 සහ ඊට වැඩි පුද්ගලයින් වන අතර අන් අයගේ මරණ අනුපාතය අඩුය. කොවිඩ් රෝගයෙන් මිය යන 70ට අඩු අය අතර, වැඩි සංඛ්‍යාවක් දුම්බොන්නන් බව සනාථ වි තිබේ. මෙම රෝගයෙන් සිදුවන මරණ අනුපාතය අඩු කර ගැනීම උදෙසා වැඩිහිටියන් ව ආරක්ෂා කිරීමට දක්වන විශේෂ උනන්දුව මෙන්ම, දුම් බොන්නන්ගේ දුම්බීම නතර කිරීමට උනන්දු වීමෙන් ද එම මරණ අනුපාතිකය තව දුරටත් අඩුකර ගත හැකි වීමට ඉඩ ඇත.

ඇතම් රටවල දුම්පානය කරන්නන්ට ප්‍රසිද්ධියේ අනතුරු අඟවා නැති අතර පූර්ව ආරක්ෂණ ක්‍රම අනුගමනය කරන ලෙස පමණක් ඉල්ලා සිටියි. බොහෝ විට දුම්පානය කරන්නන්ට වැඩි අවදානමක් ඇති බව සැඟවීමට දුම්කොළ කර්මාන්තයට අවශ්‍ය නිසා මෙසේ වනවා විය හැකිය. දුම්කොළ කර්මාන්තයට මෙම පණිවිඩය පැතිරවීමට අවශ්‍ය නොවන අතර එම කර්මාන්තයට අවශ්‍ය නොවන දේ සාමාන්‍යයෙන් සිදු නොවේ. අනෙක් අතට දුම්බීම නිසා ඇති වන පිළිකා සහ හෘද රෝග හේතුවෙන් දුම්බොන්නන් මිය යාමට පෙර, ඔවුන් කොවිඩ් රෝගයෙන් මිය යනවා දැකීමටද මේ කර්මාන්තය කිසිසේත් කැමති නැත.

දුම්කොළ කර්මාන්තය බොහෝ විට කැමති වන්නේ දැන් මෙන් ජනගහනය තුළ වෛරසය පැතිරීම නැවැත්වීමට උත්සාහ කරන ක්‍රියාමාර්ග පමණක් ගනු දැකීමට ය. වැඩිහිටි හෝ තරුණ දුම්බොන්නන්ට පූර්ව අරක්ෂිත පියවරක් ලෙස වහාම දුම්බීම නැවැත්වීමට අනතුරු අඟවා තිබීම හොඳය, මන්ද ඔවුන් කොවිඩ් ආසාදනයෙන් මිය යාමේ වැඩි අවදානමක් ඇති හෙයිනි. නමුත් දුම්කොළ කර්මාන්තය කැමති වන්නේ එයට නොවේ. එය ඔවුන්ගේ ප්‍රතිරූපයට දැවැන්ත හානියකි.

අපි දැන් රටක් ලෙස ‘වැඩිහිටියන්‘ වෛරසයට නිරාවරණය වීම අවම කිරීමට සහ ස්වයං හුදකලා වීමට බලගන්වන අකාරයෙන්ම දුම්බොන්නන් එයින් නිදහස් වීමට බලගැන්විය යුතුය. නමුත්
මෙම පණිවිඩය ප්‍රසිද්ධියේ නොඇසෙන්නේ මන්දැයි තේරුම් ගැනීමෙන් දුම්බොන්නන්ටද බොහෝදේ අවබෝධ කරගත හැකිය.

දුම්බොන්නන්ට ඇති අවදානම පැහැදිළිවම සනාථ වි තිබියදීත් තම පාරිභෝගිකයින්ට ප්‍රසිද්ධියේ නිල වශයෙන් අනතුරු හැඟවීමක් නොකර නිහඬව සිටින මේ තත්ත්වය හරහා දුම් කොළ කර්මාන්තය තම පාරිභෝගිකයන් කෙරෙහි දක්වන සැලකිල්ල මොනවට පැහැදිළි වෙයි.